# පාංශු සංරක්ෂණ හා ඉඩම් හායනය වැළැක්වීමේ ආඥා පනත

පාංශු සංරක්ෂණය, පාංශු ඛාදනය නිසා හායනයට ලක් වූ ඉඩම් ප්‍රතිෂ්ඨාපනය කිරීම, ලවණතාවය, ක්ෂාරියතාවය, ජලය රදා පැවතීම සහ පාංශු දූෂණය හේතුවෙන් සිදුවන හානිවලට එරෙහිව හානියට ලක්වූ ඉඩම් ප්‍රතිෂ්ඨාපනය කිරීම සහ හෝ ආරක්ෂා කිරීම මගින් පසෙහි නිෂ්පාදන ධාරිතාව වැඩිදියුණු කිරීම සහ චිරස්ථායීව පවත්වාගෙන යාම සඳහා ද එයට ආනුෂංගිත කාරණා සඳහා ද 1951 අංක 25 දරණ පාංශු සංරක්ෂණ පනත පරිච්ජින්න කිරීම සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ.

**ලුහුඩු නාමය**

1. මෙම ආඥා පනත 2013 අංක _____ දරණ පාංශු සංරක්ෂණ හා ඉඩම් හායනය වැළැක්වීමේ ආඥා පනත නමින් හැඳින්විය හැකිය.

**පරිපාලනය**

## පනතේ පරිපාලනය

2(1) කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා (මෙහි මින්මතු අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස හැඳින්වෙන) විසින් පනතට අදාල ප්‍රතිපාදන පහත මින්මතු සඳහන් කරන ආකාරයට පරිපාලනය කරනු ඇත.

2(2) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ස්වාභාවික සම්පත් කළමණාකරණ මධ්‍යස්ථානය පනත ක්‍රියාත්මක කිරීමේ කේන්ද්‍රීය ස්ථානය වන අතර ස්වාභාවික සම්පත් කළමණාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා, ( මෙහි මින්මතු අධ්‍යක්ෂවරයා ලෙස හැඳින්වෙන) අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙනුවෙන් මෙම පනත ක්‍රියාත්මක කිරීමේ වගකීම දරන්නේය.

2(3) අධ්‍යක්ෂවරයාට සහාය වීම පිණිස ස්වාභාවික සම්පත් කළමණාකරණ මධ්‍යස්ථානයට පාංශු සංරක්ෂකවරයෙකු පත් කරනු ලබන අතර එම නිළධාරියා ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ පශ්චාත් උපාධි සුදුසුකම් සහිත ස්වාභාවික සම්පත් කළමණාකරණය පිළිබඳ ප්‍රමාණවත් සුදුසුකම් සහිත පළමු පන්තියේ නිළධාරියෙකු විය යුතුය.

2(4) පාංශු සංරක්ෂකවරයා අධ්‍යක්ෂවරයාගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියා කරනු ඇත.

2(5) පාංශු සංරක්ෂකවරයාගේ කාර්යභාරය වන්නේ ,

(a) පාංශු සංරක්ෂණය හා ඉඩම් හායනය වැළැක්වීමේ ආඥා පනත ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂවරයාට සහාය වීම.

(b) අනෙකුත් පාර්ශවකාර ආයතන සමග සම්බන්ධීකරණය පවත්වාගෙන යාම.

(c) පාංශු ඛාදනය හා පාංශු හායනයට ලක්විය හැකි ප්‍රදේශ සංරක්ෂිත හා ප්‍රතිසංස්කරණය කරන ලද ප්‍රදේශ පිළිබඳ ජාතික දත්ත පද්ධතියක් පිහිටුවීම, වැඩිදියුණු කිරීම හා පවත්වාගෙන යාම.

(d) පර්යේෂණ හා සංවර්ධන අවශ්‍යතා හඳුනා ගැනීම.

(e) අධ්‍යක්ෂවරයා විසින් පවරනු ලබන අදාල වෙනත් කරුණු.

**බලය ලත් නිළධාරින් පත් කිරීම**

3(1) මෙම පනත වෙනුවෙන් ඕනෑම නිළධාරියෙකු හෝ පුද්ගලයෙකු බලයලත් නිළධාරියෙකු ලෙස පත් කිරීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට හැකිය.

3(2) මෙම පනතේ විධි විධාන වලට අනුකූලව උප වගන්ති 3(1) යටතේ පත්කරනු ලබන සෑම බලයලත් නිළධාරියෙකු විසින්ම පනතේ විධි විධාන හා රෙගුලාසි වලට අනුකූලව ක්‍රියාත්මක වීම සඳහා ඉඩම් හිමියන් හෝ අනෙකුත් පුද්ගලයන් යොමුකිරීමේ හෝ නියෝග නිකුත් කිරීමේ බලය ලබන්නේය.

3(3) සෑම බලයලත් නිළධාරියෙකුගේම ක්‍රියාකාරිත්වය, කාර්යසාධනය අදාල මෙහෙයවීම් වලට අනුකූල වන්නේ ද යන බවත් බලතල වලින්, ක්‍රියාකාරිත්වයෙන් හෝ සේවයෙන් ඉවත් කළ යුතු ද යන්න සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයා විසින් කාලයෙන් කාලයට ලිඛිතව බලයලත් නිළධාරින් සමග සන්නිවේදනය කල හැකිය.

3(4) මෙම පනතට හා එහි රෙගුලාසි වලට අදාලව යම්කිසි රාජකාරියක් ඉටුකිරීමේ අරමුණින් ඕනෑම බලයලත් නිළධාරියෙකුට තනිව හෝ අවශ්‍යතාවය අනුව වෙනත් පුද්ගලයන් සමග ඕනෑම සුදුසු වේලාවක ඕනෑම ඉඩමකට හෝ දේපළකට ඇතුල් වී පරීක්ෂණ පැවැත්වීම විභාග කිරීම හා පනතට අදාල විධි විධාන ක්‍රියාත්මක කිරීම නීත්‍යානුකූල වේ.

3(5) පනතේ උප වගන්ති 3(4) ට අනුකූල රාජකාරි ඉටුකිරීමට බාධා කරන පුද්ගලයෙකු හෝ ආයතනයක් මෙම පනත යටතේ වරදකරුවෙකු වන්නේය.

**බලතල පැවරීම**

4. මෙම පනත මගින් හෝ යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට පවරා දෙනු ලැබූ කුමන හෝ බලයක්, කාර්යය භාරයක් හෝ කර්තව්‍යයක් ස්වාභාවික සම්පත් කළමණාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයාට සහ පළාත්වල පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන් ට ලිඛිතව පවරා දිය හැකිය. මෙවැනි නිළධාරින්ගේ රාජකාරි ඉෂ්ඨ කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ මාර්ගෝපදේශ මෙහෙයවීම හා අධීක්ෂණය යටතේ සිදුවනු ඇත.

## අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණ ක්‍රියාවලිය හා මූල්‍ය කළමණාකරණය

**පාංශු සංරක්ෂණ හා ඉඩම් හායනය වැළැක්වීමේ උපදේශක සභාව පත් කිරීම**

5(1) (මෙහි මින්මතු උපදේශක මණ්ඩලය යනුවෙන් සඳහන් කරනු ලබන) පාංශු සංරක්ෂණය හා ඉඩම් හායනය වැලැක්වීමේ උපදේශක සභාවක් පිහිටුවනු ලැබිය යුතුය.

5(2) උපදේශක සභාව පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත යුතුය.

(a) පහත සඳහන් නිල බලයෙන් පත්වන සාමාජිකයන්

i) කෘෂිකර්ම, පරිසර, ඉඩම්, වාරිමාර්ග, වන සම්පත්, වැවිලි කර්මාන්ත, මහා මාර්ග, මහවැලි ආපදා කළමණාකරණ, ගොවිජන සංවර්ධන අමාත්‍යාංශ වල අදාල විෂය භාර ලේකම්වරුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන්.

ii) අධ්‍යක්ෂ ජනරාල්.

iii) අධ්‍යක්ෂ.

iv) කෘෂිකර්ම අමාත්‍යාංශයේ ස්වාභාවික සම්පත් කළමණාකරණ ඒකකයේ අධ්‍යක්ෂවරයා

(b) පහත සඳහන් සාමාජිකයන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

i) පාංශු සංරක්ෂණය හා ඉඩම් හායනය වැලැක්වීම පිළිබඳ ක්‍රියාකාරකම් වල නියැලෙන ලියාපදිංචි වෘත්තීය ආයතනයක නියෝජිතයෙකු.
සහ

ii) පාංශු සංරක්ෂණය හා පාංශු හායනය වැලැක්වීම පිළිබඳ ක්‍රියාකාරකම් වලට සම්බන්ධ විශේෂඥ පුද්ගලයෙකු.

(c) අවශ්‍ය නම් උපදේශක සභාවේ තීරණය අනුව ඕනෑම ආරාධිත පුද්ගලයෙකු.

5(3) කෘෂිකර්ම විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා උපදේශක සභාවේ සභාපතිවරයා වන්නේය.

5(4) අධ්‍යක්ෂ ජනරාල්වරයා උපදේශක සභාවේ ලේකම්වරයා වන්නේය.

5(5) (a) මෙම කොටසේ (b) ඡේදයේ 2 වන උප කොටසෙහි පත්කරන ලද සාමාජිකයන් "පත්කළ සාමාජිකයන්" ලෙස හැඳින්විය යුතුය.

(b) පත්කළ සාමාජිකයෙකුට අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක සිය ධූරයෙන් ඉල්ලා අස්විය හැකිය.

(c) අමාත්‍යවරයා විසින් කිසිම හේතුවක් නොදක්වා ඕනෑම අවස්ථාවක පත්කළ සාමාජිකයෙකු එම ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය.

(d) b සහ c ඡේද වල විධි විධාන වලට යටත්ව පත්කළ සාමාජිකයෙකුගේ ධූර කාලය අවුරුදු 03 ක් විය යුතුය.

(e) පත්කළ සාමාජිකයෙකු මිය යාම, ඉල්ලා අස්වීම, ධූරයෙන් ඉවත් කිරීම හෝ අන්‍ය ආකාරයකින් සිය ධූරය හිස්කරන අවස්ථාවක දී අමාත්‍යවරයා විසින් ඔහු වෙනුවට එම සාමාජිකයා අයත්ව සිටි කාණ්ඩයෙන් වෙනත් තැනැත්තෙකු පත් කළ හැකිය. එසේ වුව ද මේ ඡේදය යටතේ පත්කළ සාමාජිකයෙකු ඔහුගේ පූර්වගාමියාගේ ධූර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය තුල ධූරය දැරිය යුතුය.

(f) රෝගාතුර වීම හෝ ආශක්නුතාවට පත්වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා තම ධූරයේ කාර්යය ඉටුකිරීමට යම් සාමාජිකයෙකුට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක අමාත්‍යවරයා විසින් ඔහු වෙනුවට වැඩබැලීම සඳහා එකී සාමාජිකයා අයත් වන කාණ්ඩයෙන් වෙනත් යම් තැනැත්තෙකු පත් කරනු ලැබිය හැකිය.

5(6) (a) උපදේශක සභාවේ ගණ පූර්ණය සම්පූර්ණ සාමාජිකත්වයෙන් බාගයකට වැඩිවිය යුතුය.

(b) කුමන කරුණක් සම්බන්ධයෙන් වුව ද ඡන්දය දීමේ අයිතිය කමිටු සාමාජිකයන් සතුය.

(c) අවම වශයෙන් උපදේශක සභාව මාස 06 කට වරක් රැස්විය යුතුය.

(d) කමිටුවේ සාමාජිකයන් සඳහා පාරිශ්‍රමික සහ ගෙවීම කරනු ලබන ආකාරය අමාත්‍යවරයා විසින් මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ විමසීමෙන් පසු තීරණය කරනු ලැබිය හැකිය

5(7) උපදේශක සභාවේ ක්‍රියාකාරකම්

(a) පනතෙහි 7 වන වගන්තියට අනුව පිහිටවනු ලැබූ පාංශු සංරක්ෂණය හා ඉඩම් හායනය වැලැක්වීමේ අරමුදල පරිපාලනය සඳහා කෘෂිකර්මය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාට අවශ්‍ය උපදෙස් ලබා දීම.

(b) පාංශු සංරක්ෂණය හා ඉඩම් හායනය වැලැක්වීම සම්බන්ධ වැඩසටහන් සහ පනතෙහි විධි විධාන සාර්ථකව ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය මූලධනය, භෞතික හා මානව සම්පත් පහසුකම් සලසා දීම.

(c) පාංශු සංරක්ෂණය හා ඉඩම් හායනය වැලැක්වීමේ තාක්ෂණික කමිටුව විසින් ඉදිරිපත් කරන කාරණා/යෝජනා සඳහා අදහස් දැක්වීම, විසඳුම් ඉදිරිපත් කිරීම හා අනුමැතියන් ලබා දීම.

(d) අන්තර් අමාත්‍යාංශ සහ අන්තර් ආයතන සම්බන්ධීකරණය.

**පාංශු සංරක්ෂණ හා ඉඩම් හායනය වැලැක්වීමේ තාක්ෂණ කමිටුව පත් කිරීම**

6(1) මෙම පනතේ කාර්යයන් සඳහා (මෙහි මින්මතු තාක්ෂණික කමිටුව ලෙස හැඳින්වෙන) පාංශු සංරක්ෂණය හා ඉඩම් හායනය වැලැක්වීමේ තාක්ෂණික කමිටුවක් පිහිටවනු ලැබිය යුතුය.

6(2) මෙම කමිටුව පහත දක්වා ඇති පරිදි සමන්විත විය යුතුය.

(a) පහත නම් සඳහන් නිල බලයෙන් පත්වන සාමාජිකයන්

i) අධ්‍යක්ෂ ජනරාල්
ii) අධ්‍යක්ෂ
iii) කෘෂිකර්ම අමාත්‍යාංශයේ ස්වාභාවික සම්පත් කළමණාකරණ ඒකකයේ අධ්‍යක්ෂවරයා
iv) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ස්වාභාවික සම්පත් කළමණාකරණ මධ්‍යස්ථානයේ පාංශු සංරක්ෂකවරයා
v) පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවල පළාත් අධ්‍යක්ෂවරුන්
vi) ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නායයෑම් අධ්‍යයන අංශයේ අංශ ප්‍රධානියා
vii) හඳබිම අධිකාරියේ විධායක අධ්‍යක්ෂවරයා

(b) පහත නම් සඳහන් නිල බලයෙන් පත්වන සාමාජිකයන් හෝ ඔවුන්ගේ නියෝජිතයන්

i) වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා
ii) අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා
iii) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයා
iv) ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා
v) ඉඩම් පරිහරන හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා
vi) මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා
vii) ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා
viii) කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයා
ix) වන සංරක්ෂක ජනරාල්
x) ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ අධ්‍යක්ෂවරයා
xi) ශ්‍රී ලංකා පොල් පර්යේෂණායතනයේ අධ්‍යක්ෂවරයා
xii) උක් පර්යේෂණායතනයේ අධ්‍යක්ෂවරයා
xiii) නාගරික සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයා
xiv) මාර්ග සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයා
xv) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැණීම් කාර්යංශයේ සාමාන්‍යාධිකාරිවරයා
xvi) ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයා
xvii) ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරිවරයා

6(3) තාක්ෂණික කමිටුවේ කාර්යභාරය වන්නේ

(a) පාංශු සංරක්ෂණය හා ඉඩම් හායනය වැලැක්වීමේ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම සඳහා වගකිවයුතු ආයතන වලට යෝජනා කිරීම.

(b) (i) පාංශු සංරක්ෂණය හා ඉඩම් හායනය වැලැක්වීම.

(ii) ඉඩම් වල ඵලදායීතාවය ඉහළ නැංවීම හා චිරස්ථායීව පවත්වාගෙන යාම.

(iii) පාංශු ඛාදනය, ලවණතාව, ක්ෂාරීයතාවය, ජලය රඳා පැවතීම හා පාංශු දූෂණය නිසා හායනයට ලක්වූ ඉඩම්වල ඵලදායීතාවය ප්‍රතිෂ්ඨාපනය කිරීම.

(iv) හායනයට ලක්වීමේ අවදානම සහිත ඉඩම් ආරක්ෂා කිරීම.

(v) පස හා පසෙහි ඵලදායීතාවය ආරක්ෂා කිරීමට අත්‍යාවශ්‍ය වන ජලය හා ජලාධාර සංරක්ෂණය සහ ජලාශ වාරිමාර්ග හෝ ඉඩම් ගොඩවීම යන කරුණුවලට අදාලව වගකිවයුතු ආයතනවලට පර්යේෂණ සංවර්ධන වැඩසටහන් හා අනෙකුත් තාක්ෂණික කරුණු සම්බන්ධයෙන් යෝජනා කිරීම

6(4) උපදේශක සභාවට භාරදීමට පෙර පාංශු සංරක්ෂණය හා ඉඩම් හායනය වැලැක්වීමේ ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘති යෝජනා විශ්ලේෂණය කිරීම.

6(5) තාක්ෂණික කමිටු සාමාජිකයන්ට යම් දීමනාවක් ගෙවීමට මුදල් අමාත්‍යවරයාගේ උපදේශකත්වයෙන් අමාත්‍යවරයාට තීරණය කළ හැකිය.

6(6) තාක්ෂණික කමිටුව මාස හයකට වරක් හෝ අවශ්‍යතාවයක් මතුවන අවස්ථාවක රැස්විය යුතුය.

6(7) අධ්‍යක්ෂ ජනරාල්වරයා තාක්ෂණික කමිටුවේ මුලාසනය දැරිය යුතුය.

6(8) අධ්‍යක්ෂවරයා තාක්ෂණික කමිටුවේ ලේකම්වරයා ලෙස කටයුතු කළ යුතුය.

**පාංශු සංරක්ෂණ හා ඉඩම් හායනය වැළැක්වීමේ අරමුදලක් පිහිටුවීම**

7(1) පනත සම්බන්ධයෙන් මූල්‍ය ගනුදෙනු සඳහා "පාංශු සංරක්ෂණය හා ඉඩම් හායනය වැලැක්වීමේ අරමුදල් " නමින් අරමුදලක් පිහිටුවිය යුතුය.

7(2) (a) (i) අරමුදලේ ප්‍රයෝජනය සඳහා කාලයෙන් කාලයට පාර්ලිමේන්තුව මගින් සම්මත කරනු ලබන සියලුම මුදල්.

(ii) දේශීය හෝ විදේශීය මූලාශ්‍ර වලින් ලැබෙන යම් පරිත්‍යාග හෝ ප්‍රදාන.

(iii) පනතෙහි විධි විධාන මගින් අරමුදල සඳහා ගෙවීමට නියමකර ඇති මුදල්.

සහ

(iii) පනතෙහි ප්‍රතිපාදන වලට අනුකූලව අධිකරණය මගින් නියමකරන ලද දඩ මුදල් වලින් භාගයක් මෙම අරමුදල සඳහා ගෙවිය යුතුය.

(b) (i) මේ පනත යටතේ බලතල කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී සහ ඉටු කිරීමේදී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය කරන සියලුම මුදල්.

(ii) පාංශු සංරක්ෂණය හා භූමි ඵලදායිතාවය ආරක්ෂා කිරීමට අදාලව තාක්ෂණික තොරතුරු ජනනය කිරීම සඳහා පර්යේෂණ කටයුතු සිදුකිරීම වෙනුවෙන් දැරීමට සිදුවන වියදම්.

(iii) පාංශු සංරක්ෂණය හා භූමි ඵලදායිතාවය ආරක්ෂා කිරීමට අදාලව උපදේශක කමිටුව තීරණය කරනු ලබන සියලු මුදල් මෙම අරමුදල මගින් ගෙවිය යුතුය.

7(3) උපදේශක සභාවේ මගපෙන්වීම යටතේ කෘෂිකර්මය විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා අරමුදල පාලනය කළ යුතුය.

## නියෝග සෑදීම

නියෝග

8(1) නියෝග සෑදිය යුතු කරුණක් ලෙස මේ පනතින් නියමිත හෝ නියෝග සෑදීමට මේ පනතින් අවශ්‍ය වූ හෝ බලයක් දෙනු ලැබූ ඇති හෝ යම් කරුණක් සම්බන්ධයෙන් කෘෂිකර්මය විෂය භාර අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකිය

(2) ඉහත (1) වන උප වගන්තියෙන් පවරා ඇති බලතල වලට අගතියක් නොමැති වන සේ කෘෂිකර්මය විෂය භාර අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන කුමන කරුණක් හෝ කරුණු සියල්ල වෙනුවෙන් නියෝග පැනවීමට අමාත්‍යවරයාට හැකිය.

(a) පාංශු ඛාදනය හා ඉඩම් හායනය පාලනය සඳහා ඉඩම් හිමියන් විසින් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාවය.

(b) පාංශු ඛාදනය හා ඉඩම් හායනයට ඉවහල්වන කුමන ක්‍රියාමාර්ගයක් හෝ තහනම් කිරීම හෝ සීමා කිරීම.

(c) පාංශු ඛාදනයට එරෙහිව ජල උල්පත් දිය කඳුරු හා අනෙකුත් ජල තලයන්වල ඉවුරු සංරක්ෂණය කිරීම සඳහා ඉඩම් හිමියන් විසින් පියවර ගැනීමේ අවශ්‍යතාවය.

(d) ගං ඉවුරු ඛාදනයට හේතු විය හැකි කිසියම් ද්‍රව්‍යයක් දිය කඳුරු වලින් ජල මාර්ග වලින් හෝ ගංඉවුරු වලින් ඉවත්කිරීමට හෝ කිසියම් ද්‍රව්‍යයක් ගං ඉවුරු වලට හෝ ජල මාර්ග වලට දැමීම තහනම් කිරීම හෝ සීමා කිරීම.

(e) පාංශු ඛාදනය හා භූමි හායනය පාලනය කිරීමේ අරමුණින් එසේ කිරීම අවශ්‍ය වූ අවස්ථාවල දී වගා කිරීමේ හෝ තෘණ බිම් වැවීමේ කටයුතු සඳහා ඉඩම් යෙදවීම සීමා කිරීම.

(f) පාංශු ඛාදනයට හේතු විය හැකි වන හා තෘණ භූමි සම්පත් භාවිතය තහනම් කිරීම හෝ සීමා කිරීම.

(g) ලැව් ගිනි ඇති වී එමගින් පාංශු ඛාදනය සිදුවිය හැකි වන හා තෘණ භූමි සම්පත් භාවිතය තහනම් කිරීම හෝ සීමා කිරීම.

(h) ඉඩමක සතුන් තණ කෑමෙන් එම ඉඩම වගාවට බාධාවක් වේ නම් නැතහොත් එසේ තණ කෑමෙන් පසෙහි සාරවත් භාවය අඩු කිරීමේ ප්‍රමාණයට හෝ නැතහොත් එයින් පස සෝදායාමෙන් වන අලාභයට අනුබල ලැබේ නම් එම ප්‍රමාණයට පූර්වෝක්ත ඉඩමේ සතුන් තණ කෑම සීමා කිරීම.

(i) ගිනි පැතිරීමට හේතුවන හේන් ගිනි තැබීම් සහ තෘණ භූමි ගිනි තැබීම තහනම් කිරීම හෝ සීමා කිරීම.

(j) පාංශු සංරක්ෂණය හා ප්‍රශස්ථ ජල භාවිතය සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් නිශ්චිත ප්‍රදේශවල සී සෑම් සහ ජල සම්පාදන ක්‍රම පිළිබඳ පිරිවිතර දැක්වීම.

(k) හායනයට ලක්වීමේ අවදානම සහිත ඉඩම් ආරක්ෂා කිරීම සහ එවැනි ඉඩම් වල ඵලදායීතාවය නැංවීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග.

(l) ඉඩම් වල ජලය නොබැසී රැඳා පැවතීම, ලවණතාවයට සහ / හෝ ක්ෂාරීයතාවයට ලක්වීම වැලැක්වීම සඳහා ඊට වග කිවයුතු ඉඩම් හිමියන් හෝ පුද්ගලයන්, සංවිධාන සුදුසු පියවර ගැනීමේ අවශ්‍යතාවය.

(m) පාංශු දූෂණය වැලැක්වීම සඳහා ඉඩම් හිමියන් විසින් ගතයුතු ක්‍රියාමාර්ග.

(n) පස සංරක්ෂණය කර ගැනීමේ අවශ්‍යතාවය මත ජලය සහ ජලාධාර සංරක්ෂණය සඳහා ගතයුතු ක්‍රියාමාර්ග.

(o) කුමන හෝ රජයේ දෙපාර්තමේන්තුවක හෝ ප්‍රාදේශීය අධිකාරියක් යටතේ පවතින මහා මාර්ග හා අනෙකුත් පාරවල නෙරුම් සහ හරස් ජලවහන මාර්ග හා ඇළවේලි ශුද්ධ කිරීම තහනම් කිරීම හෝ පාලනය කිරීම.

(p) ව්‍යාපෘති යෝජනාකරුවන් හෝ ඉඩම් සංවර්ධනය කරන්නන් පාංශු ඛාදනය පාලනය, ඉඩම් හායනය වැළැක්වීම, ජලය රඳා පැවතීම, ලවණතාවය සහ / හෝ ක්ෂාරීයතාවය සහ පාංශු දූෂණය වැඩිවීම වැලැක්වීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාවය.

**සාමාන්‍ය විධිවිධාන**

9. අමාත්‍යවරයාට පාංශු ඛාදනය සහ ඉඩම් හායනයට හේතුවන සාධක ඵලදායිව පාලනය ඉහළ නැංවීම සඳහා සාමාන්‍යයෙන් සියලුම ප්‍රදේශ සඳහා අදාලවන අවශ්‍ය විධිවිධාන පැනවිය හැක.

**පාංශු සංරක්ෂණ හා ඉඩම් හායනය වැළැක්වීමේ ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම**

10. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ප්‍රදේශයේ වැදගත්කම හා සංවේදීතාවය මත තීරණය කරන ලද ප්‍රදේශ අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද නියෝගයක් මගින් කුමන හෝ ප්‍රදේශයක් පාංශු සංරක්ෂණ හා ඉඩම් හායනය වැලැක්වීමේ ප්‍රදේශ (මෙහි මින්මතු සංරක්ෂණ ප්‍රදේශ ලෙස හඳුන්වනු ලබන) ලෙස ප්‍රකාශයට පත් කළ හැකිය.

**පාංශු සංරක්ෂණ හා ඉඩම් හායනය වැළැක්වීමේ ප්‍රදේශ සඳහා විධිවිධාන**

11.(1) පාංශු ඛාදනය සහ ඉඩම් හායනයට හේතුවන සාධක ඵලදායීව පාලනය සහතික කරනු වස් අමාත්‍යවරයා විසින් සියලුම සංරක්ෂණ ප්‍රදේශ සඳහා හෝ විශේෂයෙන් යම් විශේෂිත සංරක්ෂණ ප්‍රදේශයක් සඳහා අදාලවන විධිවිධාන පැනවිය හැක.

11(2) සංරක්ෂණ ප්‍රදේශ සඳහා විධිවිධාන ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කරනු ලැබූ පසු මෙමගින් සාමාන්‍ය විධිවිධාන (9 වැනි වගන්තිය) යටතේ ප්‍රසිද්ධ කරන ලද විධිවිධාන අභිභවනය කරනු ඇත.

**පාංශු ඛාදනය හා ඉඩම් හායනය වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය වන ඉඩම් අත්පත්කර ගැනීම**

12. කිසියම් සංරක්ෂණ ප්‍රදේශයක පිහිටි කිසියම් ඉඩමක් දැනට පවත්නා ඉඩම් පරිහරණයෙන් ඉවත් කළ යුතු යැයි හෝ එබදු ඉඩමක හෝ එබදු ඉඩමක් සම්බන්ධයෙන් පස සෝදා යාම හා ඉඩම් හායනය නැවැත්වීමේ හෝ අඩු කිරීමේ කිසියම් ක්‍රියාමාර්ගයක් ආණ්ඩුව මගින් කළ යුතු යයි හෝ අමාත්‍යවරයාට ඒත්තු ගිය කල්හි එම ඉඩම පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය යයි ප්‍රකාශ කරන්නට අමාත්‍යවරයාට පිළිවන. එබදු ප්‍රකාශයක් කල ඉක්බිති එම ඉඩම වර්ෂ 1950 හේ අංක 9 දරණ ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ ආණ්ඩුවට ලබා ගනු ලැබේ. තව ද එම පනතේ (2 වෙනි හා 3 වෙනි වගන්තිවල විධිවිධාන හැර) සෙසු විධිවිධාන යථා පරිදි අදාල වන්නේය.

**නිර්දේශිත ක්‍රියාකාරකම් සඳහා පාංශු සංරක්ෂණ හා වැසි ජල කළමණාකරණ සැලැස්ම**

13(1) මෙම අරමුණ වෙනුවෙන් අධ්‍යක්ෂවරයා විසින් අනුමත කර ඇති පාංශු සංරක්ෂණ හා වැසි ජල කළමණාකරණ සැලැස්මක් නොමැතිව මෙම පනතින් ඉලක්කකරගත් අරමුණු වලට බලපෑමක් වන කිසිදු කාර්යයකට කිසිම පුද්ගලයෙකු සම්බන්ධ නොවිය යුතුය. මෙම කාර්යයන් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කර ගැසට් නිවේදනයක් මගින් නිර්දේශ කරනු ඇත.

13(2) අමාත්‍යවරයා විසින් පාංශු සංරක්ෂණ හා වැසි ජල කළමණාකරණ සැලැස්මට අදාලව අනුමත කරන ක්‍රියා පිළිවෙළ අදාල කොන්දේසි සහ ගාස්තු පිළිබද විධිවිධාන පනවනු ඇත.

## වැරදි හා දණ්ඩන

වැරදි හා දණ්ඩන

14. මෙම ආඥාපනත යටතේ සම්පාදිත කිසියම් නියෝගයක් හෝ එබඳු කිසියම් නියෝගයක් යටතේ කරන ලද හෝ දෙන ලද කිසියම් නියෝගයක් හෝ උපදේශයක් කඩ කරන්නා වූ නැතහොත් ඉටුනොකර හරින්නාවූ ද (වගන්ති 9 සහ 11 යටතේ ) මෙම ආඥා පනත යටතේ අධ්‍යක්ෂවරයාට හෝ එබඳු නිළධාරියාට බලය දී ඇති හෝ පැවරී ඇති කිසියම් කාර්යයක් හෝ යුතුකමක් කිරීමේ දී හෝ ඉටුකිරීමේ දී අධ්‍යක්ෂවරයාට හෝ එබඳු අනෙක් නිළධාරියෙකුට විරුද්ධ වන්නා වූ නැතහොත් බාධා කරන්නා වූද කවර පුද්ගලයෙක් වුව ද නීති කඩ කිරීමේ වරදකාරයා වන අතර මහේස්ත්‍රාත් කෙනෙකු ඉදිරියේ ලඝු නඩු විසඳුමකින් වරදකාරයා වීමේ දී පුද්ගලයෙකුට රුපියල් පනස්දහසකට නොඅඩු සහ ලක්ෂයකට නොවැඩි, ආයතනයකට රුපියල් ලක්ෂ තුනකට නොඅඩු සහ ලක්ෂ පහකට නොවැඩි දඩ මුදලක් හෝ මාස තුනකට නොවැඩි සිර දඬුවමකට යටත් වන්නේය.

## වෙනත් කරුණු

විධිවිධාන සඳහා සාමාන්‍ය ප්‍රතිපාදන

15.(1) මෙම පනතෙහි සියලු විධිවිධාන ගැසට් පත්‍රයක් මගින් ප්‍රසිද්ධ කළ යුතු අතර එම විධිවිධාන එසේ ප්‍රකාශයට පත් කළ දිනයේ සිට හෝ එම විධිවිධාන වලින් නිශ්චය කරන ලද ඊට පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක කල හැකිය.

15(2) මෙම පනතෙහි විධිවිධාන ගැසට් පත්‍රයක් මගින් ප්‍රසිද්ධ කළ වහාම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතුය. එසේ අනුමත නොවූ කිසියම් විධිවිධානයක් එම අනුමත නොවූ දින සිට අවලංගු වූ සේ සැලකිය යුතු නමුත් එමගින් ක්‍රියාත්මක කල කිසියම් කරුණකට අගතියක් සිදු නොවිය යුතුය.

15(3) කිසියම් විධිවිධානයක් අවලංගු කලා සේ සැලකිය යුතු දිනය ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කළ යුතුය.

15(4) මෙම පනත මගින් ප්‍රසිද්ධ කරනු ලබන සියලු විධිවිධාන පනතෙහි අඩංගු අනෙකුත් කරුණු සේ සමානව නීත්‍යානුකුල වන සේ සැලකිය යුතුය.

ඉඩම් හිමියන් එසේ ක්‍රියාත්මක වීමට අපොහොසත් වන විට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයාට ඇති අධිකාරී බලය

16(1) මෙම පනතින් පනවන ලද කිසියම් විධිවිධානයකට අනුව කිසියම් ඉඩමක කිසියම් ඉඩම් හිමියෙකු ක්‍රියාමාර්ගයක් ගැනීමට අපොහොසත් වන ඕනෑම අවස්ථාවක ඉඩම් හිමකරුට නිර්දේශිත යම් කාලසීමාවක් ලබාදීම පිළිබඳ දැනුම් දීමෙන් අනතුරුව එම ක්‍රියාමාර්ගය හෝ එම ඉඩම සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමට අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙනුවෙන් ලිඛිතව අධිකාරි බලය පවරනු ලැබූ කිසියම් නිළධාරියෙකු යෙදවීමට අධ්‍යක්ෂ ජනරාල්වරයාට නීත්‍යානුකූල බලය පවතින අතර එසේ අධිකාරි බලය පවරන ලද කිසියම් නිළධාරියෙකුට අවශ්‍ය උපකරණ සහ ඔහුගේ අවශ්‍යතාවය අනුව වෙනත් කිසියම් පුද්ගලයන් සමග කිසියම් ඉඩමකට ඇතුලු වී අත්‍යවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට නීත්‍යානුකූලව බලය පවතින්නේය.

16(2) පනතෙහි පළමුවන උප වගන්තිය මගින් පවරන ලද බලතල අනුව කිසියම් ඉඩමක එසේ සිදුකරනු ලබන යම්කිසි කාර්යයක් වෙනුවෙන් දැරීමට සිදුවන වියදම් ඉඩම් හිමියා විසින් නිර්දේශ කරන ලද කොටස් වශයෙන් ගෙවිය යුතු අතර එසේ කිසියම් කොටසක් නොගෙව්වේ නම් නීතිමය ක්‍රියාමාර්ගයෙන් රජයේ අයභාරයක් සේ අයකරගත හැකි වන්නේය.

1951 පාංශු සංරක්ෂණ පනත අවලංගු කිරීම

17. 1951 අංක 25 දරණ පාංශු සංරක්ෂණ පනත මෙයින් පරිච්ජින්න කරනු ලැබේ.

18. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස,

“අධ්‍යක්ෂ ජනරාල්වරයා” යන්නෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ.

"අරමුදල" යන්නෙන් 7(1) වන වගන්තිය මගින් පිහිටුවන ලද පාංශු සංරක්ෂණය හා ඉඩම් භායනය වැලැක්වීමේ අරමුදල අදහස් වේ.

"අයිතිකරු" යන්න යම් ඉඩමක් සම්බන්ධයෙන් යෙදුන විට ඉඩමේ බදු ගැනුම්කරු හෝ උගස් ගැනුම්කරු ඊට ඇතුළත් වේ.

"දිය කඳුරු" යන්නට අවුරුද්ද පුරා හෝ කන්නයක් පමණක් පවතින සියලු ස්වාභාවික දිය පහරවල් ඇතුලත් වේ.

**අනනුකූලතාවයක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව**

19. මෙම පනතෙහි සිංහල සහ දෙමළ භාෂා අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.